# මනෝවිද්‍යාව සහ භාෂාව; මනෝවිද්‍යාව තුළ භාෂාවේ වැදගත්කම

කුඹුකන්දන රේවත හිමි

## Abstract

Language is the tool to exchange the ideas, views, wants and suchlike and it generates psychological make-up in the individual. Psychology as a pure and applied discipline deals with human life in which language in every sense plays the unforgettable role in every instance. Thus, language is an influential variable in every branch of both pure and applied psychology. Therefore, psychology cannot neglect the role of languages and vise versa. Moreover, as there avails a strong language-psychology connection, these two variables mutually influences on each other. Everything positive and negative in human life is shared, uncovered and disclosed through language usage. Therefore, in counseling and psychotherapeutic context, the quality and success of the counselor-counselee relationship and its therapy itself would be determined by right understanding and correct usage of language. In cognitive psychological sense, language is related with cognitive abilities and all the cognitive functions and processes are intertwined with language. Nevertheless,

Language is very crucial in understanding the psychological processes of human life in social context as well. Not only language represents one's social status but social influences as well as understanding the social world take place through language usage. People are attracted to one's words, tones and the style of speaking. Thus, it is obviously noticed that a strong language-psychology connection exists and therefore, language is a significant factor in psychology.

**Key Words:** cognition, Counselling, Language, Psycho-therapy, Psychology.

### සාරසංක්ෂේපය

මනෝවිද්‍යාව මිනිසාගේ ජීවිතය තේමා කොට ගත් ශාස්ත්‍රීය හා ප්‍රායෝගික විෂයයකි. මිනිසා විසින් සිය අදහස් හුවමාරු කර ගැනීමට යොදා ගනු ලබන ප්‍රධාන මෙවලම ලෙසට භාෂාව හඳුනාගනු ලැබේ. මනෝවිද්‍යාව හා භාෂාව වෙන් වූ විෂයන් දෙකක් ලෙසට පෙනී ගිය ද ඒවා අතර ඉතා දැඩි සම්බන්ධතාවක් ඇති බවට නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, මනෝවිද්‍යාවට භාෂාවේ ඇති උපයෝගිතාව පෙන්වාදීමයි. එබැවින් අධ්‍යයනයේ පහසුව සඳහා උපදේශන මනෝවිද්‍යාව, ප්‍රජානන මනෝවිද්‍යාව හා සමාජ මනෝවිද්‍යාව යන මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍ර තෝරාගනිමින් ඒ විෂය ක්ෂේත්‍රවලට භාෂාවේ ඇති වැදගත්කම හඳුනාගැනීම මේ අධ්‍යයනයේ දී සිදුවිය. ඒ අනුව අධ්‍යයනයේ අරමුණුවලට ගැළපෙන පරිදි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ එළඹුම අනුගමනය කරමින් ලේඛන පරීක්ෂා ක්‍රමය යොදාගැනීමෙන් දත්ත ලබාගන්නා ලදි. එම අදාළ දත්ත ලබාගැනීමේ දී මනෝවිද්‍යා ග්‍රන්ථ සාහිත්‍යය හා පර්යේෂණ සාහිත්‍යය විමර්ශනය කරන ලදි. එහි දී මුලින් දක්වා ඇති පරිදි, අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රජානන මනෝවිද්‍යාව, උපදේශන හා මනෝප්‍රතිකාර හා සමාජ මනෝවිද්‍යාව යන විෂයන්ට අදාළ ව පමණක් සාහිත්‍යය විමර්ශනය කර ඇත. එලෙසට ලබාගනු ලැබූ ද්විතියික දත්ත ප්‍රධාන තේමා තුනක් යටතේ ගුණාත්මක ව විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ලෙස මනෝවිද්‍යාත්මක ප්‍රපංච තුළ භාෂා භාවිතය සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් පර්යේෂකයන් විසින් දක්වනු ලැබ ඇති බව හඳුනාගැනීමට හැකි විය. සියලු මනෝවිද්‍යා ක්‍රියාවලීන් හා සංකල්ප තුළ භාෂාවේ මැදිහත්වීම දක්නට ලැබෙන අතර මනෝවිද්‍යාඥයින් මිනිසුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා හා සිදුවීම් සම්බන්ධ ව කටයුතු කිරීමේ දී සේවාලාභීන්ගේ භාෂා භාවිතය කෙරෙහි විශේෂ අවධානයක් යෙද විය යුතු බව පර්යේෂණ සාහිත්‍යය නිරීක්ෂණයෙන් හඳුනාගැනීමට හැකි විය. ඒ අනුව උපදේශනය, මනෝප්‍රතිකාර, මිනිසාගේ සමාජ ජීවිතය හා ප්‍රජානනය සම්බන්ධයෙන් භාෂාව ඉතා වැදගත් විචල්‍යයක් ලෙසට සැලකිය යුතු බවට යෝජනා කළ හැකි ය.



ප්‍රමුඛ පදඃ උපදේශනය, ප්‍රජානනය, භාෂාව, මනෝප්‍රතිකාර, මනෝවිද්‍යාව

### හැඳින්වීම

මනෝවිද්‍යාව මිනිස් ජීවිතය පිළිබඳ විෂයයි. ඒ තුළ මිනිසුන්ගේ චර්යාවන්, මානසික ක්‍රියාවලීන්, මානසික ජීවිතය, චිත්තවේග, හැඟීම්, සිතුවිලි යනාදි ජීවිතයට අදාළ කරුණු හදාරනු ලැබේ. ඊට ශුද්ධ හා ව්‍යවහාරික යනුවෙන් අංශ දෙකක් ඇත. ශුද්ධ මනෝවිද්‍යාව මිනිස් ජීවිතය පිළිබඳ දැනුම ගොඩනගද්දී ව්‍යවහාරික මනෝවිද්‍යාව තත් ඥානය මිනිස් දිවියට ව්‍යවහාර කරයි. එබැවින් මනෝවිද්‍යාවෙන් කෙරෙන මෙම කාර්යයන් දෙකේ දී ම භාෂාවේ භාවිතය අනිවාර්ය වේ. මිනිසා පිළිබඳ විෂයක් ලෙස මනෝවිද්‍යාවට භාෂාවේ බලපෑමෙන් මිදිය නොහැකි ය. භාෂාව මනෝවිද්‍යාවට ද මනෝවිද්‍යාව භාෂාවට ද අන්‍යෝන්‍ය වශයෙන් බලපාන්නේ ය. එහෙත් මෙහි දී මනෝවිද්‍යාවට භාෂාවේ ඇති වැදගත්කම පමණක් අවධානයට ගෙන ඇත. වෙනත් සමාජීයවිද්‍යාවන්ට මෙන් ම මනෝවිද්‍යාවට ද භාෂාව සම්බන්ධයෙන් ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. එබැවින් මනෝවිද්‍යාවට භාෂාව වැදගත් වන්නේ කෙසේ ද යන්න විශේෂයෙන් හඳුනාගත යුතු ය.

භාෂාව යොදාගැනීමෙන් මිනිස්සු විවිධ කාර්යයන්හි යෙදෙති. ඔවුහු විධානයන් කරති. ඔවුහු භාෂාව මාර්ගයෙන් පොරොන්දු දෙති. සමාව ගනී, ඔවුහු භාෂාව යොදා ගැනීම මාර්ගයෙන් විවේචනයේ යෙදෙති. තව ද ඔවුහු භාෂාව භාවිතයෙන් ඔවුන්ගේ දුක ප්‍රකාශ කරති. ඔවුහු සිය ජීවිතයේ අසීරුතා දක්වති. එමෙන් ම ඔවුහු එදිනෙදා දිවියේ අද්දකින ගැටලු කියති. භාෂාව මිනිසාගේ අනන්‍යතාව, මතකයන් මෙන්

ම අනුභූතීන් යනාදි සියල්ල සකස් වීම සම්බන්ධයෙන් විශේෂයෙන් දායක වෙයි. පුද්ගලයාගේ ඉතිහාසය, සංස්කෘතිය, ජාතිකත්ව-සමාජ-ආර්ථික-ලිංගික හා ආධ්‍යාත්මික අනන්‍යතාව හා අනුභූතින් ද භාෂාව මගින් ආවරණය වෙයි. එමතු ද නොව මනෝවිද්‍යා ප්‍රතිකාරවල දී භාෂාව අතිශය වැදගත් වෙයි. එහි ප්‍රතිකාරවේදීන් සේවාලාභීන් සමග සම්බන්ධතා හා විශ්වාසය ගොඩනගා ගැනීම, සායනිකයන්ගේ මෙන් ම සේවාලාභීන්ගේ ද අභ්‍යන්තරික ලෝක වටහා ගැනීම යනාදි සැම තැන්හි ම විශ්වාසය තබන්නේ භාෂාව මත ය. සායනිකයන් විසින් භාෂාව මගින් සංයුක්ත මෙන් ම සංකේතාත්මක අර්ථ ද මිනිසුන්ගේ අනුභූති ද විස්තර කරනු ලබන ආකාරය තේරුම් ගනු ලැබිය යුතු වෙයි. භාෂාවකට සමාජීය බලපෑමෙන් මිදිය නොහැකි අතර ම සමාජ ජීවිතය සම්බන්ධ මනෝවිද්‍යා ක්‍රියාවලීන් භාෂාවෙන් වියෝජනය කොට දැක්වීමට ද නොහැකි ය. භාෂා භාවිතය යනු සංකීර්ණ ප්‍රජානනමය කාර්යයකි. එය ප්‍රජානන හැකියාවක් හෝ ක්‍රියාවලියක් ද වෙයි. භාෂා භාවිතය ප්‍රජානන මනෝවිද්‍යාවෙන් වෙන් කොට හැදෑරීම උගහට ය. මේ ආකාරයට මනෝවිද්‍යාවේ සැම විෂය ක්ෂේත්‍රයක් තුළ ම භාෂාවේ වැදගත්කම මෙන් ම බලපෑම ද මනා ව දැකගැනීමට පිළිවන. ඒ අනුව මෙහි දී මනෝප්‍රතිකාර, ප්‍රජානන මනෝවිද්‍යාව හා සමාජ මනෝවිද්‍යාව යන විෂය ක්ෂේත්‍රවලට පමණක් සීමාවෙමින් භාෂාව හා මනෝවිද්‍යාව අතර පවත්නා සම්බන්ධතාව තත් සාහිත්‍යය මත පදනම් ව විමර්ශනය කර ඇත.

## පර්යේෂණ ගැටලුව

මනෝවිද්‍යාවේ භාෂාවේ වැදගත්කම හඳුනාගැනීමේ අරමුණින් කරන ලද මෙම සාහිත්‍යය විමර්ශනමය අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව පහත පරිදි වෙයි.

භාෂාව මනෝවිද්‍යාවට වැදගත් වන්නේ කෙසේ ද?

## පර්යේෂණ අරමුණු

මනෝවිද්‍යාව හා භාෂාව අතර පවත්න සම්බන්ධතාව හඳුනාගනිමින් මනෝවිද්‍යාව සම්බන්ධයෙන් භාෂාව වැදගත් වන විවිධ ආකාර අධ්‍යයනය කිරීම හා හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි.



## පර්යේෂණ ක්‍රමවේදය

මනෝවිද්‍යාවේ භාෂාවේ භූමිකාව හඳුනාගැනීමේ අරමුණින් සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා සුදුසු පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ එළඹුම (Qualitative Research Approach) තෝරාගනු ලැබිණි. මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන් ම ද්වීතියික දත්ත මත පදනම් වේ. තත් ද්වීතියික දත්ත ලබාගැනීම සඳහා අදාළ පර්යේෂණ හා ග්‍රන්ථ සාහිත්‍යය පරිශීලනය කරන ලදි. ඒ අනුව අදාළ ද්වීතියික දත්ත රැස්කිරීමේ උපකරණය ලෙස ලේඛන පරීක්ෂා ක්‍රමය (Documentory Searching) යොදාගනු ලැබිණි. එම ලබාගත් දත්ත ප්‍රධාන තේමා තුනක් යටතේ විශ්ලේෂණයට හා සාකච්ඡාවට ලක්කෙරිණි.

## ප්‍රජානන මනෝවිද්‍යාව හා භාෂාව

ප්‍රජානනය තේමා කොට ගත් මනෝවිද්‍යා අංශය, ප්‍රජානන මනෝවිද්‍යාවයි. ප්‍රජානනය යනු පොදු වචනයකි. ඒ වචනයෙන් මොළයෙන් කෙරෙන සියලු කාර්යයන් අදහස් වෙයි. අවධානය, සංජානනය, මතකය, නිර්මාණශීලීත්වය හා ගැටලු විසඳීම යනාදි සියලු කාර්යයන් නියෝජනය කරන තනි වචනය වනුයේ ප්‍රජානනයයි. භාෂා උපාර්ජනයේ සියලු ප්‍රජානන ක්‍රියාවලීන් අන්තර්ගත වනු දක්නට ලැබේ. භාෂාව මිනිසුන්ගේ ප්‍රජානන හැකියාවන් සමග සම්බන්ධ ය. භාෂාවක වචන මගින් යමක් අර්ථවත් ව ප්‍රකාශ කිරීමට නම් ඒ වචන පිළිගත් ව්‍යූහයකට සංවිධානය කළ යුතු ය. ඒ වචන අවබෝධ කර ගනු ලබනුයේ ඒවාට ලබා දී ඇති අර්ථයන්ට අනුව ය. එමෙන් ම වචන වාක්‍ය කාණ්ඩ (phrases) හෝ වාක්‍යයන් (sentences) තුළට සම්බන්ධ කරනුයේ ද ක්‍රමවත් විධිමත් වාක්‍ය රීතින්ට (syntax rules) අනුව ය. කථනයේ මෙන් ම ලේඛනයේ දී ද වචන යොදා ගනු ලැබිය හැකි ආකාරයන්ගේ විවිධත්වයක් ඇත. මේ නිසා භාෂාවක් නම්‍යශීලි හා ගතික බවින් යුක්ත ය. මෙයින් කියවෙන්නේ භාෂාව නිරන්තරයෙන් වෙනස් වන බවයි. ඒ වෙනස්කම්වලට අනුව ප්‍රජානනය ද නැවත සකස් විය යුතු වෙයි. තව ද භාෂාව අභිමතයෙන් ද යුක්ත වෙයි. ලේඛනයේ දී හෝ කථනයේ දී අදහස් හා සිතුවිලි සුදුසු ආකාරයට පරාවර්තනය කිරීම සඳහා පුද්ගලයාට අවශ්‍ය පරිදි වචන තෝරා ගත හැකිය. භාෂාව හා පුද්ගලයා අතර සම්බන්ධතාව ගොඩනැගෙන

හැමවිට ම එය මිනිසාගේ ප්‍රජානනය සමඟ සම්බන්ධ වෙයි. ප්‍රජානනික සම්බන්ධතාවකින් තොර ව භාෂා භාවිතයක් දැකිය නොහැකි ය.

භාෂාවක් යනු එකිනෙකා සමග සන්නිවේදනය කර ගැනුම සඳහා මිනිසුන් විසින් යොදා ගනු ලබන සංකීර්ණ විධික්‍රමයකි (complex method). භාෂාව ව්‍යුහගත විය යුතු අතර වචන මත පදනම් විය යුතු ය. ඒ වචන ශබ්ද මාලාව (lexicon) හැටියට මිනිසුන්ගේ මනසේ ගබඩා වී ඇත. භාෂාව යනු සුදුසු ආකාරයකට කතා කිරීම හෝ ලිවීම අතරතුර වචන යොදා ගැනීම සඳහා පවත්නා පද්ධතියක් හෝ ව්‍යුහයකි. එලෙසට සැලකීමේ දී ශබ්දමාලාව යනු මිනිසුන්ගේ මනසේ ආරක්ෂා වී ඇති වචනයන්ගේ සංකීර්ණයයි. පළමු භාෂාවේ වචන පනස් දහසක් ද දෙ වන භාෂාවන්ගේ වචන දහස් ගණනක් ද ශබ්දමාලාවන්ගේ ස්වරූපයෙන් වැඩිහිටියකුට ආරක්ෂා කර ගත හැකි ය (**Willingham,** 2007). ලේඛනය හා කථනය සඳහා සුදුසු පරිදි යොදා ගැනීමේ පහසුව සඳහා මනසේ තැන්පත් ව ඇති ශබ්දමාලාවේ වචන වර්ග කරනු ලැබේ. ඒ අනුව භාෂා ක්‍රියාවලීන් මිනිසුන්ගේ ප්‍රජානනය හා මතකය සමග සමීප ව සම්බන්ධ වී ඇත. භාෂාව මිනිසාට ලෝකය පිළිබඳ ව දැනුම ලබාදෙමින් ඒ දැනුම වචන තුළ තහවුරු කරයි.

ප්‍රජානන මනෝවිද්‍යාවේ වැදගත් මනෝවිද්‍යාත්මක නිර්මිතයක් ලෙසට නිර්මාණශීලිත්වය දක්නට ලැබේ. එය නව අදහස් හා දේවල් නිෂ්පාදනයට හා පරිකල්පනයට ඇති හැකියාව ලෙසට හඳුනාගැනේ. අලුත් යමක් නිර්මාණය කිරීම මෙන් ම කලාත්මක සම්පත්වලින් යුක්ත මනසක් ඇති බව යන ස්වභාවය නිර්මාණශීලිත්වයේ දක්නට ලැබේ. McDonough **(2015)** ගේ නිර්මාණශීලිත්වය හා ගැටලු විසඳීම පිළිබඳ පර්යේෂණ ලිපියක Feldhausen and Westby **(2003)** දෙදෙනා නව අදහස් නිෂ්පාදනය, ගැටලු විසඳීම, සැලසුම්, කලා වැඩ, ගී තනු නිර්මාණ, නවකතා, කවි, රචනා, සිද්ධාන්ත යනාදි පුද්ගලයාට අලුත් බවක් හා වටිනාකමක් ලබාදෙන එමෙන් ම සමාජයේ සියලු දෙනා විසින් වටිනා බවට අදහස් කරනු ලබන සියල්ල නිර්මාණශීලිත්වයට අයත් වන බව පවසන බව දක්වෙයි. නිර්මාණශීලිත්වය භාෂා ඉගෙනුම සම්බන්ධයෙන් බලපායි. නිර්මාණශීලි පුද්ගලයන්ට අලුත් බව (novelty) සමග මනා ව කටයුතු කළ හැකි බව Sternberg **(2002)** කියයි.



ඉගෙනුම්කරුවන්ගේ විශ්වාස ද භාෂා ඉගෙනුම සම්බන්ධයෙන් බලපාන බව හඳුනාගත හැකිය. ඒ අනුව භාෂා ඉගෙනුම්කරුවන්ගේ විශ්වාස ඉගෙනුම් ඵල පැහැදිලි කිරීමේ දී වැදගත් වන බවට සලකා ඇත. ඔවුන්ට භාෂාවන්ගේ අසීරුතා, ඉගෙනුම් ක්‍රමවේද, ඉගෙනුම් ශිල්පක්‍රම, භාෂා දැනුම ලබාගැනීමේ මාර්ග, දැනුම ලබාගැනීමේ හැකියාව යනාදිය පිළිබඳ විශ්වාස ඇත. ඉහත McDonough (2015) ගේ ගේ ලිපිය තුළ ද Dörnyei (2001) ඉගෙනුම්කරුවන් තුළ භාෂා ඉගෙනුම් සම්බන්ධ යථාර්ථවාදි විශ්වාස (language learning beliefs) ගොඩනැගීමෙන් ඔවුන් ව භාෂා ඉගෙනුමට අභිප්‍රේරණය කළ හැකි බව යෝජනා කරන බව සඳහන් වෙයි. භාෂා ඉගැන්වීමේ දී ගුරුවරුන්ට ද විශ්වාස පවතී. ගැහැණු ළමයින් පිරිමි ළමුන්ට වඩා භාෂා ඉගෙනුමට වඩාත් දක්ෂ බව එවැනි විශ්වාසයකි. එවැනි විශ්වාස සහිත ව ඉගැන්වීම් කිරීමේ දී ගැහැණු ළමයින්ට වැඩි සැලකීමක් සිදුවන බවට ද විවේචන පවතී.

චින්තනය ද ප්‍රජානන මනෝවිද්‍යා සංකල්පයකි. එය ද හැමවිට ම භාෂා භාවිතය සමග බැඳී ඇත. මිනිසා චින්තනයේ යෙදෙනුයේ භාෂාවක් යොදාගැනීමෙනි. පර්යේෂකයන්ට අනුව භාෂාව යනු චින්තනය සඳහා වන මෙවලමකි (Semin, 1998). තව ද මිනිසා සමග නිතර ම ගැටෙන උත්තේජ පිළිවෙළකට තබාගැනීමට ද භාෂාව උපකාරි වෙයි. ලෝකය පිළිබඳ ව සිතන ආකාරය හා ලෝකය සංජානනය කරන ආකාරය ද කෙනෙකු විසින් යොදාගනු ලබන භාෂාවේ ස්වභාවය, වචන, හා ව්‍යාකරණ ව්‍යුහය යනාදියට බලපායි. ඒ ආකාරයට භාෂාව චින්තනයට ද චින්තනය භාෂාවට ද අන්‍යෝන්‍ය වශයෙන් බලපායි. ඒ දෙක අතර අන්‍යෝන්‍ය සබඳතාවක් (language-thought relationship) ඇත. භාෂාව මිනිසුන් විසින් තොරතුරු ක්‍රියාත්මක කරනු ලබන ආකාරය සඳහා ද බලපායි. තව ද ප්‍රජානන මනෝවිද්‍යාවට අනුව කෙනෙකු චින්තනයේ යෙදෙන්නේ සිය මව් භාෂාවෙනි. වෙනත් භාෂා උගෙන ගත්ත ද චින්තනය සැකසෙන්නේ පළමු බසිනි.

පුද්ගලයන්ගේ ප්‍රජානන හැකියාවන්ගේ වෙනස්කම් සඳහා හේතු වනුයේ ද ඔවුන් විසින් භාවිතා කරනු ලබන භාෂාවන්ගේ විවිධත්වයයි. චින්තනයට භාෂාව බලපාන එක් ආකාරයක් වනුයේ ස්කිමාවන් (schemas) ය. එක් එක් භාෂාවන්ට අනුව වස්තූන් පිළිබඳ ව පවත්නා

ස්කිමාවන් වෙනස් වෙයි. නිදසුන් ලෙස අංක පිළිබඳ විවිධ භාෂාවන් සතු ස්කිමාවන් පෙන්වාදිය හැකිය. අංක නම් කිරීම සඳහා ක්‍රමානුකූල පද්ධතියක් ඉංග්‍රීසි භාෂාවට ඇත. 1 සිට 10 දක්වා ක්‍රමානුකූල අංක පද්ධතියක් දක්නට ලැබෙන අතර 11 සිට 19 දක්වා වෙනස් වූ අංක පද්ධතියක් භාවිත වෙයි. චීන භාෂාව ගත්විට අංක 10 මත පදනම් වූ සම්පූර්ණ ක්‍රමානුකූල පද්ධතියක් අංක සඳහා පවතී. එහි 11 යනු 10 සහ 1යි. එබැවින් චීන ළමයින්ට වඩා ඉංග්‍රීසි කතා කරන ළමයින් 11 සිට 19 දක්වා ගණනයන් කිරීමේ දී අපහසුතාවලට මුහුණ දෙන බව පර්යේෂකයන්ගේ පිළිගැනීමයි (Dimitrova ඇතුළු පිරිස, 2021).

ඉහතින් පෙන්වාදුන් ආකාරයට ප්‍රජානනයත් භාෂාවත් අතර ඇත්තේ වෙන් කළ නොහැකි සම්බන්ධයකි. භාෂාව යොදාගැනීම යනු සපුරා ප්‍රජානන ක්‍රියාවලියකි. අවධානය, මතකය, සංජානනය, චින්තනය හා තර්කනය යනාදි ප්‍රජානන ක්‍රියාවලීන් භාෂා උපාර්ජනය හා භාෂා භාවිතයේ අන්තර්ගත වෙයි. ප්‍රජානන ක්‍රියාවලීන් ක්‍රියාත්මක වීමට ද භාෂාව අනිවාර්ය වෙයි. ඒ අනුව භාෂාව තුළ ප්‍රජානන මනෝවිද්‍යා සංකල්ප ද ප්‍රජානන මනෝවිද්‍යා සංකල්පයේ භාෂාව ද ක්‍රියාත්මක වනු දැකිය හැකි වෙයි.

## උපදේශන මනෝවිද්‍යාව, මනෝප්‍රතිකාර හා භාෂා භාවිතය

උපදේශන මනෝවිද්‍යාව හා තදනුබද්ධ ප්‍රතිකාර සම්පූර්ණයෙන් ම පාහේ සේවාලාභියා හා උපදේශකවරයා යන දෙදෙනා අතර ගොඩනැගෙන සම්බන්ධතාව මගින් තීරණය වන්නකි. මේ සම්බන්ධතාව ගොඩනැගීමට හා පවත්වාගැනීමට භාෂාව යොදාගන්නා ආකාරය මෙන් ම භාෂාව මැනවින් වටහාගැනීම ද අත්‍යවශ්‍ය වන්නේ ය. දෙදෙනා අතර ගොඩනැගෙන සාකච්ඡාව තුළ අන්තර්ගත වචනවලින් අදහස් පමණක් නොව අභිප්‍රායයන්, චිත්තවේග, අගතීන් ද ප්‍රකාශ කෙරේ. නිවැරදි වචන භාවිතයෙන් සේවාලාභීන් තුළ වෙනස්කම් ඇතිකිරීමට ද ඔවුන් විසින් මුහුණදෙනු ලබන අභියෝග මැඩපැවැත්වීමට ද හැකි වෙයි. එමෙන් ම නිවැරදි භාෂා භාවිතයෙන් සේවාලාභීන්ට පහසුවක් දැනවීමට ද අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඔවුන් ව උනන්දු කර වීමට ද අලුත් ශක්‍යතාවන් අවබෝධ කර ගැනීමට ද හැකියාව ලැබේ. ඒ අනුව උපදේශනය හා ප්‍රතිකාර සම්බන්ධයෙන් උපදේශන කාමරයක දී ක්‍රියාත්මක වන හා භාවිතයට



ගනු ලබන භාෂාවට ඇත්තේ සුවිශාල භූමිකාවකි. සේවාලාභියකු විසින් මනෝවිද්‍යා ප්‍රතිකාරවේදියකු සමීපයට පැමිණ ඔහුගේ/ඇයගේ ගැටලුවක් ඉදිරිපත් කරනු ලබන්නේ භාෂාව මාර්ගයෙනි. ඒ ගැටලුව සඳහා සුදුසු විසඳුමක් වෙත දෙදෙනා ගමන් කරනුයේ ද භාෂාව ආධාර කර ගැනීමෙනි. සායනික සන්දර්භයේ උපදේශකවරුන් සේවාලාභීන්ගේ භාෂාව තේරුම් ගන්නා තරමේ ප්‍රමාණයට ඒ සඳහා සොයාගනු ලබන විසඳුම්වල සාර්ථකත්වය තීරණය වෙයි. උපදේශනයේ දී මෙන් ම මනෝප්‍රතිකාරයේ දී ලබාදෙනු ලබන ප්‍රතිකාර භාෂාව මත පදනම් වී ඇත. බොහෝ අවස්ථාවල සේවාලාභීන්ට ප්‍රතිකාරයක් වනුයේ මනෝවිද්‍යාඥයාගේ හෝ උපදේශකවරයාගේ අවබෝධාත්මක වචනයන් ය. ඒ වචනයේ උපදේශන මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත ද ප්‍රතිකාර ශිල්පක්‍රම ද ඇතුළත් වෙයි. තව ද සහානුකම්පාව, කොන්දේසි විරහිත පිළිගැනීම යනාදි උපදේශන ගුණාංග හා කුසලතා ද ගැබ් වෙයි. මේ හේතුවෙන් උපදේශනයට හා මනෝප්‍රතිකාරවලට 'කතා ප්‍රතිකාර' (Talk Therapy) යැයි කියනු ලැබේ.

මනෝවිද්‍යා උපදේශනයෙහි නියුක්තවූවන් විසින් වර්ධනය කර ගත යුතු උපදේශන කුසලතා ද සේවාලාභීන්ගේ තෝරාගත් වචනවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් කේන්ද්‍රගත වී ඇත. උපදේශනයේ දී භාෂාව යනු තොරතුරු හුවමාරු කර ගැනීමේ මූලික මාර්ග යයි. මනෝවිද්‍යා උපදේශනයෙහි නියුක්තවූවෝ සේවාලාභීන්ගේ වචනවලට සවන්දෙති. දක්ෂ උපදේශකවරු නිවැරදි දෙය, නිවැරදි මොහොතේ නිවැරදි ආකාරයට කියති. උපදේශන හා මනෝප්‍රතිකාර සන්දර්භයක භාෂා භාවිතයෙන් සේවාලාභීන්ගේ විශ්වාස, සංස්කෘතික සම්ප්‍රදායයන්, චිත්තවේගික ප්‍රකාශන යනාදිය හුවමාරු කර ගනු ලැබේ. සේවාලාභීන්ගේ සංස්කෘතිය, සන්දර්භය, සංකල්පීය හා චිත්තවේගික අදාළත්වය යනාදිය මත ඔවුන් විසින් භාවිතා කරනු ලබන භාෂාවට විවිධ අර්ථ ඇති බව නිරීක්ෂණය වේ. සේවාලාභීන්ගේ අනුභූතීන් (කුඩා කල) හා ඒ අනුභූති සම්බන්ධ චිත්තවේග ඔවුන් ජීවත් වූ පරිසරයේ භාෂාව සමග ද ඔවුන්ගේ සංවර්ධන මට්ටම සමග ද බැඳී ඇත. සේවාලාභීන්ගේ වචන ඔවුන්ගේ ප්‍රජානනය, චිත්තවේග හා අන්තර්-පුද්ගල සම්බන්ධතාවන්ට සම්බන්ධ වන ආකාරය අවධාරණය කර ගැනීම මගින් උපදේශනය වඩාත් සාර්ථක ඉදිරි පියවරයන්ට ගෙනයා හැකිය. උපදේශකවරු වචන යොදාගනිමින් සේවාලාභීන් ව

සුවපත් කරති. වැරදි වචන සේවාලාභීන්ට චිත්තවේගික තුවාල ඇති කර ඇති ආකාරය වෙත මෙන් ම වෙනත් පුද්ගලයන් සමග සේවාලාභීන් විසින් ගොඩනගා ගනු ලබන සම්බන්ධතා තුළ වචන ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ආකාරය වෙත ද උපදේශකවරු සිය අවධානය යොදවති. මෙලෙසට මනෝවිද්‍යා සේවාවෙහි නියුක්ත වන්නෝ භාෂාව සම්බන්ධයෙන් දැඩි ව සැලකිලිමත් විය යුත්තෝ ය.

සේවාලාභීන්ගේ අද්දැකීම් ඔවුන්ගේ පළමු භාෂාව සමග බැඳී ඇති අතර එබැවින් භාෂාව වෙත අවධානය යොමු කිරීම සායනිකයන් විසින් විශේෂයෙන් සැලකිය යුතු වෙයි. සේවාලාභීන්ගේ භාෂාව මැනවින් තේරුම් ගැනීමෙන් පමණක් ගැටලු මෙන් ම ඒ සම්බන්ධ හේතු ද නිවැරදි ව වටහා ගැනීමට හා ඒ මගින් සාර්ථක ව සේවාව ලබාදීමට ද හැකි වෙයි. සේවාලාභීන් විසින් භාවිත කරනු ලබන භාෂාවන්ගේ සමහර සංකේතයන්ට අදාළ අර්ථ ඔවුන්ගේ සමාජ-සංස්කෘතික පරිසරයන්ට ආවේණික ව සංජානනය කළ යුතු වෙයි. එම නිසා මනෝවිද්‍යාඥයන්ට සේවාලාභීන්ගේ භාෂා භාවිතය තේරුම් ගැනීමට සිදුවනුයේ ඔවුන්ගේ සංස්කෘතික පසුබිම් මත පදනම් ව ය. වර්තමානයේ සියලු දෙනා ජීවත් වෙමින් සිටිනුයේ විශ්වීය ලෝකයක ය. එබැවින් සිය ජීවිත කාලයේ බොහෝ දෙනා උපන් රටෙන් බැහැර ව වෙනත් කැමති රටක ජීවත් වනු පෙනේ. සායනිකයන් මෙවැනි පුද්ගලයන්ගේ ජන්ම භාෂාව (Native language) පිළිබඳ ව සැලකිය යුතු වෙයි. ජන්ම භාෂාව යනු උපතත් සමග යොමු වූ භාෂාවයි. මනෝවිද්‍යාව දරුවන්ට භාෂාව සම්බන්ධයෙන් තාර්කික කාලපරිච්ඡේදයක් ඇති බව කියයි. ඒ කාල පරිච්ඡේදයේ යොමු වූ භාෂාව ජන්ම භාෂාවයි. වෙනත් රටකට සංක්‍රමණය වීමෙන් පුද්ගලයාට භාෂා අභිමිවීමකට මුහුණදීමට සිදුවෙයි. තමන් ජීවත් වූ හා චින්තනයට යොදාගත් භාෂාවට කිසිවක් ආදේශ කළ නොහැකි ය (**Urdang, 2016**). ඒ අනුව සේවාලාභියාට හුරුපුරුදු පළමු බසට වෙනස් වූ වෙනත් භාෂාවකින් සිය අනුභූතීන් උපදේශකවරයකුට පැවසීම ගැටලුකාරී වෙයි. වෙනත් භාෂාවක් යොදා ගනු ලබන සමාජ සන්දර්භයන්හි දී සංක්‍රමණිකයෝ ගැටලුවලට මුහුණදෙති. මෙවැනි අවස්ථාවල සායනිකයන් එක් භාෂාවක් පමණක් යොදාගැනීමෙන් සේවාලාභීන්ගේ මානසික ගැටුම් හා ආවේදනික ක්‍රියාවලීන්ට යොමු වීමේ දී බාධා ඇතිවෙයි. කෙසේ වුව ද උපදේශකවරුන්



සේවාලාභීන් ව වර්ධනය වන ආකාරය හා භාෂාව ඉගෙනු ගනු ලබන ආකාරය අවබෝධ කර ගන්නේ නම් ඔවුන්ට වඩාත් සාර්ථක විය හැකි බව කියවේ (**Faubert iy Gonzalez, 2008**). ඒ අනුව මව් භාෂාව භාවිතා නොකෙරෙන වෙනත් භූගෝලීය පසුබිම් තුළ උපදේශනය හා මනෝප්‍රතිකාරවල දී භාෂාව ඉතා වැදගත් ය.

උපදේශනයට කෙනෙකු එළඹෙන විට ඔහු හෝ ඇය රැගෙන එනුයේ ඔහුගේ හෝ ඇයගේ හදවතයි. ඒ අනුව හදවත පිළිබඳ භාෂාව බවට පත්වනුයේ වචනයන් ය. උපදේශනය මෙන් ම ප්‍රතිකාරය ද අසනු ලබන දෙය හා අවබෝධ කර ගනු ලබන දෙය හා සම්බන්ධ වේ. උපදේශකවරුන් විසින් යොදාගනු ලබන භාෂාව මගින් සේවාලාභීන්ගේ මානසික යහපැවැත්මට පහසුවක් ඇතිකරනු ලැබිය යුතු ය. එමෙන් ම ඊට හානිකරන භාෂා භාවිතයෙන් මිදිය යුතු ය. ඒ අනුව සේවාලාභීන්ගේ සංස්කෘතික පසුබිම් තේරුම් ගැනීමටත් කිසිදු ආකාරයක වෙනස්කමක් (Discrimination) නොකිරීමටත් වගබලා ගත යුතු ය. ඒ අනුව සේවාලාභීන් විසින් යොදා ගනු ලබන වචන සම්බන්ධයෙන් අවධානය දියුණු කර ගැනීම වැනි භාෂා කුසලතා වර්ධනය කර ගැනීම මගින් උපදේශකවරුන්ට, ප්‍රතිකාරවේදීන්ට හා මනෝවිද්‍යාඥයන්ට සමාජයේ මානසික සෞඛ්‍යය වඩාත් යහපත් ව පවත්වාගෙන යෑමට උදව් විය හැකිය.

චිත්තවේග යනු ඉතා වැදගත් මනෝවිද්‍යාත්මක නිර්මිතයන් ය. චිත්තවේග උපදේශන මනෝවිද්‍යාවට ද වෙනත් සෑම මනෝවිද්‍යා ක්ෂේත්‍රයකට ම ද වැදගත් වෙයි. චිත්තවේග සම්බන්ධයෙන් ද භාෂාවට සම්බන්ධතාවක් ඇති බවට පෙනීයයි. භාෂාව මගින් සේවාලාභියාගේ පොදු සංස්කෘතිය පමණක් නොව චිත්තවේගික සංස්කෘතිය (Emotional Culture) ද සන්නිවේදනය කරනු ලැබේ. පුද්ගලයා විසින් අනුභූතීන් මගින් ලබාගනු ලබන ලෝකය පිළිබඳ සංකල්පීමය දැනුම ගබඩා වී ඇත්තේ ද පළමු භාෂාවෙනි. භාෂාවක් තුළ ආදරය, බිය, තරහව යනාදි චිත්තවේග සම්බන්ධ වචන ඇත. ඒවා චිත්තවේග වචන (Emotion Words) ලෙසට නම් කර ඇත. ප්‍රජානන මනෝවිද්‍යාත්මක ව සැලකූ කල, මේ චිත්තවේග වචන ගබඩා වී ඇත්තේ මිනිසාගේ මොළයේ ය. මේ චිත්තවේග වචන පළමු භාෂාවෙන් ඉගෙන ගනු ලබන විට ඒවා ඉතා ගැඹුරින් ගබඩා වෙයි. ඊට හේතුව වනුයේ පළමු භාෂාවේ චිත්තවේග වචන බොහෝ සන්දර්භයන්හි දී අද්දැක තිබීම

හා ඒ වචන බොහෝ ආකාරවලින් ව්‍යවහාර කර තිබීමයි. එහෙත් ලැජ්ජාව වැනි චිත්තවේගයක් හා සම්බන්ධ යමක් ප්‍රකාශ කිරීමේ දී පළමු බසට වඩා දෙ වන බසක් යොදාගැනීම පහසු වෙයි. ඒ අනුව විශේෂයෙන් තහනම් වූ යමක් ප්‍රකාශ කිරීමේ දී කෙනෙකුට මව් බසට වඩා දෙ වන බස වඩාත් පහසු වේ (**Diakonova,** 2017).

උපදේශනයේ දී මනෝවිද්‍යාඥයන් විසින් භාෂාව යොදා ගැනීමේ දී චිත්තවේග වචන සමග සම්බන්ධ කරනු ලබන වචන නිතර ම නිවැරදි විය යුතු ය. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අවධානය වඩාත් යෙදවිය යුතු ය. නිදසුන් වශයෙන් බිය චිත්තවේගය සැලකිය හැකිය. චිත්තවේග යනු පුද්ගලයාට දැනෙන දේවල් ය. ඒ අනුව මනෝවිද්‍යා සේවාවන්හි නිරතවූවන් කෙනෙකුට දැනෙන බිය පිළිබඳ ව තොරතුරු ඇසීමේ දී 'ඔයාට බය හිතෙනවා ද, ඔයාට කොච්චර බය හිතෙනවා ද' යනුවෙන් ඇසීම වැරදි ය. ඒ වෙනුවට 'ඔයාට බය දැනෙනවා ද, ඔයාට කොච්චර බය දැනෙනවා' යනුවෙන් ඇසීම වඩාත් නිවැරදි ය.

උපදේශනය හා මනෝවිද්‍යා ප්‍රතිකාර භාවිතයේ දී භාෂාව උපයෝගී වන ආකාරය ඉහතින් කරන ලද පැහැදිලි කිරීම්වලින් ඉස්මතු වනු පෙනේ. මෙහි ඇත්තේ දෙපාර්ශ්වයක සම්බන්ධතාමය ගනුදෙනුවකි. එහි සාර්ථකත්වය භාෂාව මත තීරණය වන බව පෙනේ. සායනිකයන් සේවාලාභීන්ගේ භාෂා භාවිතය සම්බන්ධ ව දක්ෂ විය යුතු අතර ඒ භාෂා භාවිතය මගින් සේවාලාභීන්ගේ අනුභූති, අනන්‍යතා, ආකල්ප, සංජානන, විශ්වාස යනාදි සියල්ල තේරුම් ගත යුතු වෙයි. ඒ අර්ථයෙන්, තමා වෙත පැමිණෙන සියලු සේවාලාභීන්ගේ භාෂා හා තදනුබද්ධ සමාජ-සංස්කෘතික අර්ථ පිළිබඳ දැනුම ද සායනිකයන්ට අනිවාර්යෙන් පැවතිය යුතු ය.

### සමාජ මනෝවිද්‍යාව හා භාෂා භාවිතය

සමාජ මනෝවිද්‍යාවෙන් කෙරෙන්නේ මිනිසුන්ගේ සම්බන්ධතා තුළ අන්තර්ගත මනෝවිද්‍යා ක්‍රියාවලීන් හැදෑරීමයි. සමාජ සන්දර්භය තුළ මිනිසුන්ගේ හැසිරීම්, එකිනෙකා සමග ගත වන ජීවිතය හා එහි ඇතුළත් වන මනෝවිද්‍යා ක්‍රියාවලීන් මෙහි ඇතුළත් වනු පෙනේ. ඒ සියල්ලේ මිනිසුන් විසින් යොදා ගනු ලබන භාෂාවන් මැදිහත් වනු දක්නට ලැබේ. සමාජ අන්තර්ක්‍රියාකාරිත්වය තුළ භාෂාවේ කාර්යභාරය වටහාගැනීමට සමාජ මනෝවිද්‍යාව පිළිබඳ ව Allport (2005) විසින් දක්වා ඇති නිර්වචනය ද ඉවහල් වෙයි. ඔහු පුද්ගලයන්ගේ සිතුවිලි, හැඟීම් හා චර්යාවන්ට අනෙක් පුද්ගලයන් ව බලපාන ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමේ උත්සාහයක් ලෙසට සමාජ මනෝවිද්‍යාව දක්වයි. මේ බලපෑම මිනිසුන් සත්‍ය වශයෙන් ම ඉදිරියේ සිටින විට මෙන් ම එලෙසට නැති අවස්ථාවල ද සිදුවෙයි. භාෂාවේ බලපෑම කෙනෙකු ඉදිරිපිට දී මෙන් ම ඉදිරිපිට නැති ව ද සිදුවෙයි. අන්‍ය පුද්ගලයන් ඉදිරිපිට දී භාෂාව ඍජු ව ම පුද්ගලයාට බලපාන්නේ ය. එසේ නොවන අවස්ථාවල අන්‍ය පුද්ගලයන් විසින් කියනු ලැබ ඇති වචන, ඒ වචන කියනු ලැබ ඇති ආකාරය හා ඒ වචනයන්ගේ අර්ථ පිළිබඳ මතකය ද අදෘශ්‍යමාන ව බලපාන්නේ ය.



එකිනෙකා අතර සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී මෙන් ම ඒ සම්බන්ධතා පවත්වාගැනීමේ දී ද භාෂාව විශාල කාර්යභාරයක් ඉටුකරයි. අන්තර්පුද්ගල ආකර්ෂණයට ද භාෂාව හේතු වනු පෙනේ. මිනිසුන් අන්‍යයන්ගේ කතාවලට බැඳෙයි. කතා විලාශය මෙන් ම යොදාගනු ලබන වචන මාලාව යනාදිය මගින් කෙනෙකුට අන්‍යයන් ව ආකර්ෂණය කර ගැනීමට පිළිවන. එහි දී ඒ කතාවල අර්ථයන් ද නොසලකා හරී. භාෂාව මගින් කෙනෙකුගේ සමාජ තත්වය (Social Status) පෙන්නුම් කෙරේ. ඒ අනුව කෙනෙකු විසින් භාෂාව යොදාගනු ලබන ආකාරය වෙත අවධානය යොමු කිරීමෙන් ඒ පුද්ගලයා අයත් වන සමාජ ස්ථරය, අධ්‍යාපන මට්ටම යනාදි ය සංජානනය කළ හැක්කේ ය.

ආකල්ප යනු ද වැදගත් සමාජ මනෝවිද්‍යා සංකල්පයකි. ආකල්ප හා භාෂාව අතර ද සම්බන්ධතාවක් ඇති බවට නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව භාෂා ආකල්ප (Language Attitudes) ඇති බවට දැක ගත හැකිය. කථිකයකුගේ වාග්විද්‍යාමය ශෛලිය පිළිබඳ තක්සේරුමය ප්‍රතිචාරයන් මෙයින් අදහස් වන අතර ඒ ප්‍රතිචාරයන්ගෙන් ශ්‍රාවකයාගේ භාෂා ඥානය විද්‍යාමාන වෙයි. ශ්‍රාවකයන්ට භාෂා සම්බන්ධයෙන් හොඳ හෝ නරක ලෙසට ප්‍රතිචාර දැක්වීම පූර්වයෙන් තීරණය වන බව උපකල්පනය කෙරේ. එමෙන් ම ශ්‍රාවකයන් භාෂා ආකල්ප ඉගෙන ගනුයේ සමාජානුයෝජන ක්‍රියාවලිය හරහා ය. භාෂාව මගින් කෙනෙකු යම් කණ්ඩායමකට අයත් වන බව මෙන් ම වෙනත් කණ්ඩායම්වලට අයත් නොවන බව ද පෙන්නුම් කෙරේ (**Sani,** 2004). ඒ අර්ථයෙන්

ගත්කල, භාෂාව යනු කණ්ඩායම් අනන්‍යතාව ප්‍රදර්ශන කරනු ලබන මාර්ගයක් ද වේ.

කෙනෙකුගේ කතාව මාර්ගයෙන් ඔහු ව හෝ ඇය ව පිළිබඳ ව හඳුනාගැනීමේ ක්‍රියාවලියක ද මිනිසා යෙදේ. එය සමාජ සංජානනය හෙවත් පුද්ගල සංජානනයයි. තව ද භාෂාව මගින් කෙනෙකුගේ සමාජ අනන්‍යතාව ද පිළිබිඹු වෙයි. සමාජයේ සිටින්නේ භාෂකයින් (speakers) සහ ශ්‍රාවකයින් (hearer) ය. කෙනෙකු පවසන දෙයකින් එය අසා සිටින්නෝ ඔහු ව හෝ ඇය ව තේරුම්ගනිති. කෙනෙකු විසින් යොදාගනු ලබන වචන, ඒ වචන ප්‍රකාශ කරනු ලබන තීව්‍රතාව යනාදිය මත පදනම් ව ඔවුන්ගේ චිත්තවේගික තත්වය පිළිබඳ ව ඉඟි ලැබේ. ඒ අනුව පුද්ගලයා අදාළ යම් අවස්ථාවක පසුවන චිත්තවේගික තත්වය මනා ව තේරුම් ගැනීමට භාෂාව පදනම් කර ගත හැකි ය. නිදසුන් වශයෙන් තරහව නම් වූ චිත්තවේගය ඇතිවිට පුද්ගලයා උස් හඬින් කතා කරයි. ඔහු විසින් යොදා ගනු ලබන වචන අසාසිටින්නන්ට අප්‍රිය හා ඔවුන් ව අපහසුතාවට පත්කරවන වචනයන් ය. මෙවැනි භාෂා භාවිතයක් ඇතිවිට අදාළ පුද්ගලයාගේ සිතේ තරහව නමැති චිත්තවේගය ඇති බවට සංජානනය කිරීමේ හැකියාව ඇති අතර ඒ අනුව ඔහු සමඟ කටයුතු කළ යුතු ආකාරය තීරණය කර ගත හැකි ය.

සමාජ සංජානනයට භාෂාවේ බලපෑම කියාපාන තවත් සමාජමනෝවිද්‍යා ප්‍රපංචයකි, මූලික හේතු දැක්වීමේ වරද (fundamental attribution error). මෙයින් අදහස් වන්නේ වෙනත් පුද්ගලයන්ගේ හැසිරීම් පිළිබඳ ව පැහැදිලි කිරීමේ දී අවස්ථාමය විචල්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය නොසලකා අභ්‍යන්තරික සාධක පමණක් අවධානයට ගැනීමේ නැඹුරුතාවයි. මෙම තත්වය බටහිර සංස්කෘතීන්ට සීමා වන බවත් ඉන්දියාව වැනි රටවල දක්නට නොලැබෙන බවත් පර්යේෂකයන්ගේ විශ්වාසයයි (**Miller,** 1990). ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ ඉංග්‍රීසි භාෂාව තුළ පෞරුෂ විස්තර පද (personality descriptors) බහුල වීමත් ඉන්දියානු භාෂාවල පුද්ගලයන්ගේ චරිත ස්වභාව පිළිබඳ පද (dispositional terms) අඩු වීමත් ය. මෙයින් පැහැදිලි වන්නේ භාෂාව පුද්ගලයා තුළ ක්‍රියාත්මක වන මනෝවිද්‍යා ක්‍රියාවලීන්ට මැදිහත් වන ආකාරයයි.



මිනිසුන් අන්‍යයන් ව තේරුම් ගැනීමට මෙන් ම තමන් ව ම තේරුම් ගැනීමට ද එකිනෙකා සමඟ සම්බන්ධීකරණය කළ යුතු වෙයි. එලෙසට ඔවුන් එකිනෙකා පිළිබඳ ව සිතන ආකාරය (සමාජ ප්‍රජානනය) මෙන් ම ඔවුන්ට එකිනෙකා දැනෙන ආකාරය සම්බන්ධයෙන් ද භාෂාවක් බලපායි. කෙනෙකුගේ භාෂාවට වෙනත් පුද්ගලයන් ව බලපාන අතර අන්‍යයන්ගේ චර්යාවන්ට බලපෑම් කිරීම සඳහා මාර්ගයක් ලෙස ද භාෂාව යොදා ගැනීමට පුලුවන. භාෂාවක් යොදා ගැනීමෙන් පුද්ගලයා විසින් කරනු ලැබීමට බලාපොරොත්තු වන සියල්ල සමාජ සන්දර්භයට අදාළ ව ක්‍රියාත්මක වෙයි. එනම් සමාජ සන්දර්භය සමඟ ඒ සියල්ල අතිශය සංවේදී වෙයි. අප කියන දෙය කුමක් ද යන්න කෙරෙහි මෙන් ම අප කතා කරන ආකාරය කෙරෙහි ද ඒ කතාවන් අසා සිටින පුද්ගලයා පිළිබඳ අපගේ සංජානනය, ඔවුන් පිළිබඳ අපගේ සම්බන්ධතා බලපායි. එමෙන් ම පුද්ගලයා භාෂාවක් භාවිතා කිරීමේ දී එමගින් අන්‍යයන්ගේ චර්යාවන්, හැඟීම් හා සිතුවිලි වෙනස් කිරීම ද කරනු ලැබේ.

සමාජ මනෝවිද්‍යාවේ පර්යේෂණ සම්බන්ධ ව කල්පනා කිරීමේ දී භාෂා භාවිතය විවිධ ආකාරයට යොදා ගනු පෙනේ. ඒ අනුව පර්යේෂණවල දී වාචික උපදෙස් ලබාදෙනු ලැබේ. එලෙසට ඔවුන්ගේ හැඟීම්, ගැටලු විසඳීම් හා විනිශ්චයන් යනාදිය වාර්තා කරනු වස් දැනුම් දෙනු ලැබේ. මෙවැනි අවස්ථාවල පර්යේෂකයන් භාෂා භාවිතය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් වනු දක්නට හැකි වෙයි. එහි දී ඔවුන්ගේ උපදෙස් හා මගපෙන්වීම්වල පැහැදිලි බව පිළිබඳ සැලකිලිවත් වෙයි. ඒ අනුව සමාජමනෝවිද්‍යා දත්ත රැස්කිරීමේ දී භාෂාව යනු වැදගත් උපාංගයකි.

භාෂාව සමාජ ජීවිතයට (social life) මෙන් ම සමාජ ක්‍රියාවලීන්ට (social processes) කේන්ද්‍රීය වන්නකි. Krauss and Fussell (1996a) දෙදෙනාට අනුව වර්තමාන සමාජ මනෝවිද්‍යාව හා භාෂාව අතර ඇත්තේ 1970ට පෙර සමාජ මනෝවිද්‍යාව හා ප්‍රජානනය අතර පැවති සම්බන්ධතාවට සමාන සම්බන්ධතාවකි. (Krauss iy Fussell (1996b)' සමාජ මනෝවිද්‍යාඥයන් විසින් සමාජ ජීවිතය තුළ භාෂාවේ වැදගත්කම හඳුනාගනු ලැබුව ද ඒ සමාජ ජීවිතය තුළ භාෂාව ක්‍රියාත්මක වන ආකාරය හා සමාජ ජීවිතයට භාෂාව කේන්ද්‍ර වන ආකාරය පිළිබඳ ආනුභවික පර්යේෂණයන්ගේ අඩුවක් පවතින

බවට විශ්වාස කෙරේ. කෙසේ වුව ද සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රපංච සම්බන්ධයෙන් භාෂාවේ වැදගත්කම නොසලකා ඇති බවක් ඉන් අදහස් නොවේ. බොහෝ පර්යේෂකයන් විසින් සමාජ මනෝවිද්‍යාව හා භාෂාව සම්බන්ධ මාතෘකා පිළිබඳ ව පර්යේෂණ කර ඇත. නිදසුන් වශයෙන් Maas, Salvi, Arcuri, & Semin, (1989) යන පර්යේෂකයන් විසින් පූර්වවිනිශ්චය (prejudice) හා ඒකාකෘති (stereotypes) තුළ ඇතුළත් භාෂාව පිළිබඳ ව පර්යේෂණ කර ඇත. සමාජ හේතු දැක්වීමෙන් භාෂාවේ භාවිතය පිළිබඳ ව Hilton, 1995 විසින් ද සමාජ සංජානනය තුළ භාෂාවේ වැදගත්කම පිළිබඳ ව Berry, Pennebaker, Mueller,) Killer, 1997 යන පර්යේෂකයන් විසින් ද පර්යේෂණය කර ඇත. තව ද ඒ වෙනුවෙන් ම වෙන් වූ සඟරා හා සංගම් ද ඇති බව තවදුරටත් පෙන්වාදිය හැකිය. නිදසුන් වශයෙන් Journal of Language and Social Psychology yd International Association of Language and Social Psychology යනාදිය දැක්විය හැකිය.

සමහර න්‍යායවාදීන්ට අනුව බොහෝ සමාජ මනෝවිද්‍යා ප්‍රපංචයන්ගේ සාරය වන්නේ භාෂා භාවිතයයි. තමා පිළිබඳ සංකල්පය (the self) නිර්මාණය සඳහා වන භූමිය ලෙසට භාෂාව සලකනු ලබන බවට Gergen (1989), Harre (1986) iy Sampson (1983) යන පර්යේෂකයන්ගේ විශ්වාසය බව Holtgraves (2002) විසින් පෙන්වාදී ඇත. භාෂා භාවිතය සමඟ පුද්ගලයා තුළ තමා පිළිබඳ සංකල්පය අඛණ්ඩ ව නිර්මාණය වේ. ඒ අර්ථයෙන් තමා පිළිබඳ සංකල්පය යනු කතාන්දරයකි (story) (McAdams, 1993). එය අඛණ්ඩ ව ද නැවත නැවත ද ලියනු ලැබේ.

සමාජ මනෝවිද්‍යාවට භාෂාව වැදගත් වන්නා සේ ම භාෂාවට ද සමාජ සන්දර්භය වැදගත් වෙයි. යමෙකු වාගාලාපයක (utterance) ස්වරූපය මෙන් ම එය අර්ථකථනය කරනු ලබන ආකාරය තේරුම් ගැනීමේ දී ඒ පවසන දෙය බිහි වූ සමාජ සන්දර්භය නොසලකා හැරිය නොහැකි ය. නිදසුන් වශයෙන් යම් කථිකයකු තමාගේ අනන්‍යතාව ද අසන්නන්ගේ අනන්‍යතාවන් ද රැකිය යුතු බව පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. අනන්‍යතාව සම්බන්ධ කථිකයාගේ මෙම සැලකිලිමත් භාවය ඔහු හෝ ඇය කතා කරන ආකාරය මගින් නිරූපණය වෙයි. කතා කරන ආකාරය යනු පුද්ගලයා විසින් භාෂාව නිෂ්පාදනය කරනු ලබන ආකාරයයි. තව ද ශ්‍රාවකයන් ද ඔවුන්ගේ අනන්‍යතාවන් සම්බන්ධ ව



සැලකිල්ලෙන් යුක්ත වන අතර ඒ සැලකිල්ල කථිකයාගේ ප්‍රකාශයන් අර්ථකථනය කරනු ලබන ආකාරය (භාෂා අවබෝධය) සම්බන්ධයෙන් බලපායි. මේ ආකාරයට ගත්විට භාෂාවක මූලධර්ම සමාජ සැලකිලිමත් භාවය සමඟ බැඳී ඇත. ඒ අනුව භාෂාවක් නිර්මාණය වන ආකාරය හා එය අවබෝධ කරන ආකාරය වටහාගැනීමට සමාජීය මානයන් සම්බන්ධ සැලකිල්ල අවශ්‍ය වෙයි.

ඉහතින් පෙන්වාදුන් ආකාරයට භාෂාව මත පදනම් ව මිනිසාගේ සමාජ ජීවිතය ක්‍රියාත්මක වනු පෙනේ. ඔවුන්ගේ අදහස් හුවමාරුවට, සමාජ සංජානනයට, සමාජ ප්‍රජානනයට, සම්බන්ධතා ගෙනයෑමට මෙන් ම ආකර්ෂණයට ද භාෂාව උපයෝගී වෙයි. භාෂාව ද සමාජ සන්දර්භය මගින් තීරණය වන බව ද දක්නට ලැබේ. ඒ අනුව සමාජ මනෝවිද්‍යා සංකල්ප භාෂාවක ආධාරයෙන් ක්‍රියාත්මක වන බව ද භාෂා භාවිතය යනු සමාජ මනෝවිද්‍යා ප්‍රපංචයක් ලෙස ද සැලකිය හැකි ය.

## සමාලෝචනය

මනෝවිද්‍යාව මිනිසාගේ ජීවිතය පිළිබඳ ගනුදෙනුවකි. මනෝවිද්‍යාව විසින් මිනිස් ජීවිතය තේරුම් ගනු ලබනුයේ සිද්ධාන්ත, ආකෘති, සංකල්ප යනාදිය මගිනි. මිනිස් ජීවිතය පිළිබඳ මනෝවිද්‍යාත්මක කරුණු තේරුම් ගැනීමේ දී භාෂාව අත්‍යවශ්‍ය වේ. පුද්ගල වර්ධනය විශේෂයෙන් භාෂාව මගින් පෙන්නුම් කෙරේ. භාෂාවෙන් පුද්ගල විවිධත්වය ද සංකේතවත් වෙයි. ලෝකය මෙන් ම සමාජය සංජානනය කිරීමෙන් ද භාෂාවක ශබ්දමාලාවේ ප්‍රයෝජනය ලබයි. වචන ඔස්සේ මිනිසුන්ගේ ජීවිතයේ අසීරුතා, දුෂ්කරතා, පීඩාවන් තේරුම් ගනු ලැබ සපයනු ලබන සේවයක් බවට මනෝවිද්‍යා සේවාව පත් ව ඇත. ඒ සේවාව ක්‍රියාත්මක වන්නේ වචන යොදාගැනීමෙනි. ඒ වචනවල මනෝවිද්‍යා ප්‍රතිකාර ගැබ් වී ඇත. ඒ අනුව මනෝවිද්‍යා ප්‍රතිකාර වචන මත පදනම් වූ ප්‍රතිකාරයකි (words based therapy). භාෂාව යනු ප්‍රජානන හැකියාවකි. භාෂා ඉගෙනමෙන් ප්‍රජානන ක්‍රියාවලීන් ක්‍රියාත්මක වෙයි. තව ද ප්‍රජානන ක්‍රියාවලීන්, හැකියාවන් හෝ දක්ෂතාවන් ගොඩනැගෙන්නේ හා වර්ධනය වන්නේ භාෂාව ආධාර කර ගෙන ය. මනෝවිද්‍යාත්මක ව සැලකූ කල, භාෂා අධ්‍යයනයේ දුෂ්කරතා හේතුවෙන් පුද්ගලයාට

කාංසාව, ක්ලමථය යනාදි ඍණාත්මක චිත්තවේග ඇතිවෙයි. ඒ අනුව භාෂා උපාර්ජනය තුළ අන්තර්ගත මනෝවිද්‍යාත්මක උපාංග මෙන් ම එයින් පවත්නා මනෝවිද්‍යාත්මක බලපෑමක් ද නිරීක්ෂණය කළ හැකි වෙයි. මිනිසාගේ සමාජ ජීවිතයේ ද භාෂා භාවිතය යනු ඉතා වැදගත් විචල්‍යයකි. සමාජ මනෝවිද්‍යා ක්‍රියාවලීන් තුළ භාෂාව අනිවාර්යෙන් ම ක්‍රියාත්මක වනු පෙනේ. භාෂාව මාර්ගයෙන් සමාජ බලපෑම ද පුද්ගල සංජානනය ද අන්තර්පුද්ගල සම්බන්ධතා ද අන්තර්පුද්ගල ආකර්ෂණය ද සමාජ චින්තනය ද ක්‍රියාත්මක වන පෙනේ. මෙලෙසට මනෝවිද්‍යා පර්යේෂණයන්ගේ සිට සියලු මනෝවිද්‍යා ප්‍රපංච තුළ භාෂාමය මැදිහත්වීමක් ඇතුළත් වන බැවින් මනෝවිද්‍යාවට භාෂාව යනු ඉතා වැදගත් විචල්‍යයකැයි පෙන්වාදිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Allport, Gordon (2015). **The Encyclopedia of Social Theory**, Wiley

Berry DS, Pennebaker JW, Mueller JS, Hiller WS. Linguistic Bases of Social Perception. Personality and Social Psychology Bulletin. 1997;23(5):526-537. doi:10.1177/0146167297235008

Billy Lee (2017). **Language matters in counselling diversity,** British Journal of Guidance & Counselling, 45:5, 500-507, DOI: 10.1080/03069885.2016.1265914

Brehm, Sharon Stephens., (May 2007), **Importance of Language**, Vol 38, No. 5, retrieved December 13, 2021, https://www.apa.org/monitor/may07/pc Brehm, Sharon Stephens., (May 2007), Importance of Language, Vol 38, No. 5, retrieved December 13, 2021, https://www.apa.org/monitor/may07/pc

Carreiras M, (2010). **Language across the mind and brain.** Front. Psychology 1:14. doi: 10.3389/fpsyg.2010.00014

Diakonova-Curtis, D. (2017, February). **A deeper look at language in the therapy room**: An article review [Web article] [Review of the article The role of language in therapy with the Spanish-English bilingual client, by A. L. Santiago-Rivera, & J. Altarriba]. Retrieved from https://societyforpsychotherapy.org/the-role-of-language-in-therapy-a-summary/





Dornyei, Z., (2005).**The Psychology of the Language Learner, Individual Differences in Second Language Learning**, New Jersey, Lawrence Erlbaum.

Faubert, M., & Gonzalez, E. (2008, March). **What counselors need to know about language and language acquisition to enhance their effectiveness with clients**. Retrieved

December 13, 2021, from **http://counselingoutfitters.com/vistas/vistas08/Faubert.htm**

Federmeier, Kara D., (2020). **Examining the General Cognitive Skills in Language Processing, Current Directions in Psychological Science**, Vol.29,Issue.6,Pp.575-582,https://doi.org/10.1177/0963721420964095

Fitch, Kristine L., and Sanders, Robert E., (2005). **Hand Book of Language and Social Interaction**, New Jersey, Lawrence Erlbaum.

Hiton, Denis J., (1995).**The Social Context of Reasoning: Conversational Inference and Rational Judgment, Psychological Bulletin,** vol 118, no 2, 248-271 retrieved on 09,03,2022 from http://home.cerge-ei.cz/ortmann/Trentocourse/Hilton_Social_context_of_reasoning_1995.pdf

Holtgraves, Thomas M., (2002). **Language As Social Action; Social Psychology and Language Use,** New Jersey, Lawrence Erlbaum.

Ian R. Owen (1991). **Using the sixth sense: The place and relevance of language in counselling,** British Journal of Guidance & Counselling, 19:3, 307-319, DOI: 10.1080/03069889108260394

Kim McDonough, William J. Crawford, Alison Mackey, (2015). **Creativity and EFL Students' Language Use During a Group Problem-Solving Task,** Volume 49, Issue I, Pages 188-199, https://doi.org/10.1002/tesq.211

Maass, A., Salvi, D., Arcuri, L., & Semin, G. R. (1989). **Language use in intergroup contexts: The linguistic intergroup bias**. Journal of Personality and Social Psychology, 57(6), 981–993. https://doi.org/10.1037/0022-3514.57.6.981

McAdams, D. P. (1993). **The stories we live by: Personal myths and the making of the self**. William Morrow & Co.

Miller, A. G., Ashton, W. A., & Mishal, M. (1990). **Beliefs concerning the features of constrained behavior: A basis for the fundamental attribution error**. Journal of Personality and Social Psychology, 59(4), 635–650. https://doi.org/10.1037/0022-3514.59.4.635

Robert M. Krauss and Susan R. Fussell, (1996). **Social Psychological Model of Interpersonal Communication,** retrieved 09,03,2022 from http://citeseerx.ist.psu.edu/viewdoc/download?doi=10.1.1.559.9827&rep=rep1&type=pdf

Sani, F., & Bennett, M. (2004). **Developmental aspects of social identity.** In M. Bennett & F. Sani (Eds.), The development of the social self (pp. 77–100). Psychology Press. https://doi.org/10.4324/9780203391099_chapter_3

Semin, G. R. (2009). **Language, culture, cognition: How do they intersect?** In R. S. Wyer, C.-y. Chiu, & Y.-y. Hong (Eds.), Understanding culture: Theory, research, and application (pp. 259–270). Psychology Press.

Sieger, Karin., (2018,10,24). **Language in COunseling or Therapy,** retrieved December 13 , 2021, https://karinsieger.com/language-counselling-therapy/

Urdang, E. (2016). **Human Behavior in the social environment:** Interweaving the inner and outer worlds. New York, NY: Routledge.

Vogele, Karp., (2016), **Does Anyone Still Understand Me,** Psychotherapy and Multilingualism, Verhaltenstherapie, Vol 26, No. 3, https://doi.org/10.1159/000448818

Vulchanova, M., Vulchanov, V., Fritz, I. et al. **Language and perception: Introduction to the Special Issue "Speakers and Listeners in the Visual World"**. J Cult Cogn Sci 3, 103–112 (2019). https://doi.org/10.1007/s41809-019-00047-z

Vyara V. Dimitrova, Susan McKenney & Paul A. Kirschner (2021). **Second and foreign language teachers' problem-solving schemata development through informal problem-solving: the relationship between experience and expertise, Innovation in Language Learning and Teaching,** DOI: 10.1080/17501229.2021.2011894

Weatherall, Ann., Warson, Bernadette M., & Gallois, Cindy., (2007). **Language, Discourse and Social Psychology**, England, Palgrave Macmillan.

Willingham, D. T. (2007). **Critical Thinking: Why Is It So Hard to Teach?** American Educator, 31, 8-19.

http://www.aft.org/sites/default/files/periodicals/Crit_Thinking.pdf